ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகார அமைச்சு

Ministry of Sports and Youth Affairs




# ජාතික ක්‍රීඩා අරමුදල

# தேசிய விளையாட்டு நிதி

# National Sports Fund

# 2021

## වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

## Annual Report

# පටුන



| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | හැඳින්වීම | 03 |
| 02 | දැක්ම,මෙහෙවර | 03 |
| 03 | ක්‍රීඩා අරමුදලේ කාර්යභාරය | 04 |
| 04 | නීතිමය පසුබිම | 04 |
| 05 | ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම | 05 |
| 06 | ක්‍රීඩා තරඟ වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම | 05 |
| 07 | පුහුණු කරුවන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම | 05 |
| 08 | වෙනත් වියදම් | 06 |
| 09 | කෘතඥතාව | 07 |
| 10 | ජාතික ක්‍රීඩා අරමුදලේ විගණිත මූල්‍ය ප්‍රකාශ | 08 - 19 |
| 11 | විගණකාධිපති වාර්තාව | 20 - 27 |

# ජාතික ක්‍රීඩා අරමුදල

# වාර්ෂික වාර්තාව - 2021

## හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## දැක්ම

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ආධාර සහ අනුබල දීම ජාතික ක්‍රීඩා අරමුදලේ මෙහෙවරයි.

## ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්ය භාරය

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ක්‍රීඩා අරමුදල මඟින් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ක්‍රීඩාවට සම්බන්ධිත මානව සම්පත් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ භෞතික හා වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පවතින ප්‍රතිපාදන යටතේ අරමුදල් ලබාදීම සිදු කරනු ලබයි.

වර්තමානයේ ක්‍රීඩා අරමුදල මඟින් මතු සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අවස්ථානෝචිත පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

එනම් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ වෙනුවෙන් ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් වෙත අනුමත කර ඇති නිර්ණායකයන් යටතේ ගෙවීම් කිරීම, හඳුනාගත් නිර්ණායකයන් යටතේ මාසිකව ක්‍රීඩකයන් සඳහා සිදු කරන පෝෂණ දීමනා ගෙවීම්, ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් නිර්දේශිත විශේෂිත ඉල්ලීම් සඳහා දෙනු ලබන දීමනා, ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා කරනු ලබන ගෙවීම්, විශේෂිත වූ ක්‍රීඩා උත්සව සඳහා සිදු කරන තිළිණ ප්‍රදානයන්, විශේෂිත ප්‍රදානයන් (එනම් විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන සඳහා සිදු කරනු ලබන ක්‍රීඩා උත්සව වෙනුවෙන් ගෙවීම්, ක්‍රීඩකයන් විශ්‍රාම යාමේදී/ක්‍රීඩාවෙන් සමුගැනීමේ දී සිදු කරන ගෙවීම්, විශේෂිත ක්‍රීඩා උපකරණ ඉල්ලීම් සඳහා අනුග්‍රහය දැක්වීම්, දේශීය විදේශීය තරඟ වෙනුවෙන් විවිධ කණ්ඩායම් සඳහා කරන දීමනා ගෙවීම්, සානුකම්පිත හේතූන් මත ක්‍රීඩාවට සම්බන්ධ වූ පුද්ගලයන්ට සිදු කරන ගෙවීම් හා ක්‍රීඩාවේ සංවර්ධනය අපේක්ෂිතව සිදු කරනු ලබන වෙනත් ගෙවීම් වේ).

## නීතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතින් ජාතික ක්‍රීඩා අරමුදල ස්ථාපිත කරනු ලැබීය. පනතට අනුව අරමුදලේ කාර්යයන් සඳහා රජයෙන් ලැබිය හැකි මුදල් විදේශ රටකින් ලැබෙන ආධාර මුදල්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම පිණිස යම් ආයතනයකින් ලැබෙන මුදල්, යම් තැනැත්තෙකු විසින් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්, වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල් අරමුදලට බැරවිය යුතුය. අමාත්‍යවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, දියුණු කිරීම හා සංවර්ධනය සඳහා ද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද, ආයෝජනය කිරීම සඳහා ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්ය සඳහා ද අරමුදලෙන් මුදල් ගෙවිය හැකිය.

## ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම

දැනට ක්‍රීඩාවේ නියුක්තව සිටින ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ චිත්ත ධෛර්‍යය වර්ධනය කිරීමට හා ශාරීරික යෝග්‍යතාව ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාම අරමුණු කර ගෙන මුදල් ආධාර ලබා දෙන ලදී.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ක්‍රීඩකයින් සඳහා පෝෂණ දීමනා | 8,215,107.00 |
| 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 631,898.00 |
| | එකතුව | **8,847,005.00** |

## ක්‍රීඩා තරඟ වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම

2021 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුල පවත්වන ලද ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ සඳහා වූ ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ජාත්‍යන්තර තරඟ | 108,145,941.00 |
| | එකතුව | **108,145,941.00** |

## පුහුණු කරුවන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම

දැනට ක්‍රීඩාවේ නියුක්තව සිටින ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනය කරමින් දේශීය ක්‍රීඩා ක්ෂේත්‍රය ඉහල නැංවීම උදෙසා ඉටුකරන සේවය වෙනුවෙන් මුදල් ආධාර ලබා දෙන ලදී.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | පුහුණු කරුවන් වෙනුවෙන් දීමනා | 940,000.00 |
| | එකතුව | **940,000.00** |

## වෙනත් වියදම්

2021 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදලින් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය මත දරන ලද අනෙකුත් වියදම් විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | පරිපාලන වියදම්(ජාතික ක්‍රීඩා අරමුදලේ ගිණුම් කටයුතු වෙනුවෙන්) | 363,500.00 |
| 2 | අභියායවනා උපදේශන කමිටුව | 212,258.00 |
| 3 | ජාතික ක්‍රීඩා සභාව | 350,190.00 |
| 4 | වෙනත් දීමනා | 10,118,170.00 |
| 5 | විගණන ගාස්තු | 150,000.00 |
| | **එකතුව** | **11,194,118.00** |

# කෘතඥතාව

ජාතික ක්‍රීඩා අරමුදලේ පාලනය හා පරිපාලනය සඳහා විධාන ලබා දෙමින් එහි පරිපාලනයට මා වෙත දැක්වූ සහයෝගයට ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට කෘතඥතාව පලකරමි.එමෙන්ම ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු කලමණාකරණයට හා ගිණුම් තැබීම වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරීන්ගේ කැපවීම හා අරමුදලේ කටයුතු වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.මහේසන්
ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2021 | | සටහන | තථ්‍ය 2021 | 2020 නැවත ප්‍රකාශිත |
|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | - |
| 177,125,000 | 1- රජයේ ප්‍රදාන | 3.1 | 190,020,300 | 42,849,536 |
| 32,300,000 | 2 - ආයෝජන | 3.2 | 1,154,400 | 2,249,457.04 |
| 27,400,000 | 3 - වෙනත් ආදායම් | 3.3 | 21,474,415 | 2,452,750.00 |
| 236,825,000 | මුළු ආදායම් ලැබීම් | | 212,649,115 | 47,551,743.04 |
| - | ආදායම් නොවන ලැබීම් | | - | |
| 300,000 | 4 - තැන්පතු | 3.4 | | 377,000 |
| - | වෙනත් ලැබීම් | | | |
| 300,000 | මුළු ආදායම් නොවන ලැබීම් | | - | 377,000 |
| 237,125,000 | මුළු ආදායම් ලැබීම් සහ | | 212,649,115 | 47,928,743 |
| | අඩුකළා : වියදම් | | | |
| - | පුනරාවර්තන වියදම් | | | |
| 35,800,000 | 5.1. - ආයෝජන | | | |
| 111,000,000 | 6.1. - ක්‍රීඩා තරඟ | 4.1 | 108,145,941 | 5,786,000 |
| 10,095,000 | 6.2. - සුභසාධන දීමනා | 4.2 | 9,787,005 | 100,216,339 |
| 1,000,000 | 6.3. - සංවර්ධන ව්‍යාපෘති | 4.4 | | - |
| 74,875,000 | 6.4. - හැකියා වර්ධනය | 4.3 | 71,055,500 | - |
| 1,209,000 | 6.5 - පරිපාලන වියදම් | 4.4 | 11,194,117 | 21,715,146 |
| 233,979,000 | මුළු පුනරාවර්තන වියදම් | | 200,182,563 | 127,717,485 |
| | මුළු වියදම් | | 200,182,563 | 127,717,485 |
| 3,146,000 | 2021 දෙසැම්බර් 31 දිනට අතිරික්තය/ ඌණතාවය | | 12,466,552 | (79,788,742) |

..............................................

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නම : අනුරාධ ශ්‍රීජේකෝන්

තනතුර : ලේකම්

දිනය : තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය

නො. 09, පිලිප් ගුණවර්ධන මාවත,

කොළඹ 07.

..............................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය :

එස්.එන්. හපුආරච්චි

ප්‍රධාන ගණකාධිකාරී

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,

කොළඹ 07

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2021 දෙසැම්බර් 31 දිනට

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2021 | 2020 නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන ගිණුම | 5 | 16,089,059 | 14,645,465 |
| මුදල් ශේෂය | 6 | 15,787,820 | 17,013,369 |
| විවිධ ණය ගැතියෝ | 7 | 30,270,897 | 17,969,886 |
| මුළු වත්කම් | | 62,147,776 | 49,628,721 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සමුච්චිත අරමුදල | 8 | 61,608,273 | 49,141,721 |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ තැන්පත් | 9 | 330,000 | 340,000 |
| උපචිත වියදම් | 10 | 209,503 | 147,000 |
| ජංගම වගකීම් | | 539,503 | 487,000 |
| මුළු වගකීම් | | 62,147,776 | 49,628,721 |

පිටු අංක...01.......සිට ...03...... දක්වා ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ......04.... සිට ......11.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.............................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

අනුරාධ විජේකෝන්
ලේකම්
තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
නො. 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

.............................................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය :

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

ජාතික ක්‍රීඩා අරමුදල

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන 2021 රු. | 2020 රු. |
|---|---|---|
| වර්ෂයේ අතිරික්තය | 12,466,552 | (79,788,742) |
| | 12,466,552 | (79,788,742) |
| ආයෝජන පොලි අධි ගණනය කිරීම් | | (484,168) |
| විගණන ගාස්තු අධි වෙන්කිරීම් | | |
| මුදල් නොවන වෙනස්වීම | - | (484,168) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| ණය ගැතියෝ අඩුවීම/වැඩිවීම | 12,301,010 | 7,419,611 |
| විවිධ තැන්පතු වැඩිවීම/වැඩිවීම | (10,000) | (465,000) |
| විවිධ ණය හිමියෝ අඩුවීම/වැඩිවීම | (62,503) | (653,000) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 12,228,507 | 6,301,611 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පත් වැඩිවීම | (1,443,594) | 70,825,109 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,443,594) | 70,825,109 |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | (1,225,549) | (3,146,189) |
| කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 17,013,369 | 20,159,558 |
| කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 15,787,820 | 17,013,369 |

.............................

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම : අනුරාධ විජේකෝන්

තනතුර : ලේකම්

දිනය :

තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
නො. 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

........................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 2022/02/28

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## 2 ගිණුම් සකස් කිරීමේ පදනම

**2.1** අනුකූලතා ප්‍රකාශය

ක්‍රීඩා අරමුදලේ මූලය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය,ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත

**2.2** මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**2.3** වාර්තාකරණ කාල පරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයට අදාල වාර්තා කරන කාලපරිච්ඡේදය වේ.

**2.4** මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ අගයන් සංසන්දනාත්මකව නැවත ගැලපීම

**2.4.1** 2020 වර්ෂයේදී හඳුනාගත්තා ලද වෙනස්කම් 2020 වර්ෂයේ ගිණුම්වලට සංසන්දනාත්මකව ගැලපීම සිදුකර නැවත ප්‍රකාශිත කර ඇත.

**2.4.2** 2021 වර්ෂයේ ජනවාරි සිට වැය විෂයන් සංකේත අංක සහ ආදායම් ගිණුම් සංකේතාන්ක වෙනස් කිරීම සිදුකරන ලද අතර එම ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වර්ෂය සඳහා වන සංඛ්‍යා සංසන්දනාත්මකව නව විෂයන් සහ ආදායම් සංකේතයන්ට ගැලපීම සිදුකර ඇත

**2.5** උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

## 3 ආදායම් ලැබීම් සඳහා සටහන්

### සටහන් 03.1 - රජයේ ප්‍රදාන

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|
| 1 | | රජයේ ප්‍රදාන | | |
| 1 | 1 | ප්‍රදාන | 177,125,000 | 32,500,000 |
| 1 | 2 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | - | 10,349,536 |
| | | | 177,125,000 | 42,849,536 |

### සටහන් 03.2 - ආයෝජන

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|
| 2 | | ආයෝජන | | |
| 2 | 1 | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | |
| 2 | 2 | ස්ථාවර තැන්පතු පොළී | - | 2,249,457 |
| | | | - | 2,249,457 |

### සටහන් 03.3 - වෙනත් ආදායම්

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|
| 3 | | වෙනත් ආදායම් | | |
| 3 | 1 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | 635,200 |
| 3 | 2 | අනුග්‍රාහක ලැබීම් | 20,875,000 | |
| 3 | 3 | වෙනත් ආදායම් හා ගැලපීම් | 599,415 | 1,817,550 |
| | | | 21,474,415 | 2,452,750 |

### සටහන් 03.4 - තැන්පතු

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|
| 4 | | තැන්පතු | | |
| 4 | 1 | තැන්පතු ලැබීම් | | 377,000 |
| 4 | 2 | වෙනත් | | |
| | | | - | 377,000 |

# 4 වියදම් ගෙවීම් සඳහා සටහන්

## සටහන් 4.1 - ක්‍රීඩා තරඟ

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 1 | | | ක්‍රීඩා තරඟ | | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | | 100,000 |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 108,145,941 | 5,250,000 |
| | | | | ජාතික ක්‍රීඩා උළෙල | | 436,000 |
| | | | | | **108,145,941** | **5,786,000** |

## සටහන් 4.2 - සුභසාධන දීමනා

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 2 | | | සුභසාධක දීමනා | | |
| 6 | 2 | 1 | | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා | | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 8,215,107 | 2,160,000 |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 631,898 | 350,000 |
| | | | | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | 138,690 |
| | | | | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 5,000,000 |
| | | | | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 92,567,649 |
| 6 | 2 | 2 | | පුහුණුකරුවන් සඳහා | | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 940,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | | |
| | | | | | **9,787,005** | **100,216,339** |

## සටහන් 4.3 - හැකියා වර්ධනය

| වියදම් සංකේතය | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|---|
| 6 | 4 | | කාර්යසාධනය | | |
| 6 | 4 | 1 | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 55,655,500 | |
| 6 | 4 | 2 | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 15,400,000 | |
| 6 | 4 | 3 | නිලධාරින්ගේ හැකියා වර්ධනය | | |
| | | | | **71,055,500** | - |

## සටහන් 4.4 - පරිපාලන වියදම්

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 රු.ශත | 2020 ආදායම රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 5 | | | පරිපාලන වියදම් | | |
| 6 | 5 | 1 | | පොදු පරිපාලන වියදම් | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 363,500 | 648,000 |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 150,000 | 348,640 |
| 6 | 5 | 1 | 3 | තැපැල් ගෙවීම් | | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 10,118,170 | 423,333 |
| | | | | ඉන්ධන අත්තිකාරම් | | 206,316 |
| | | | | විවිධ අත්තිකාරම් | | 110,960 |
| | | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණ වියදම් | | 9,860,385 |
| | | | | විවිධ ගෙවීම් | | 10,117,512 |
| 6 | 5 | 2 | | ක්‍රීඩා පරිපාලන වියදම් | | |
| 6 | 5 | 2 | 1 | අභියායවනා උපදේශණ කමිටුව | 212,258 | - |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 350,190 | |
| | | | | | **11,194,117** | **21,715,146** |

## 5 ආයෝජන

| විස්තරය | 2021 රු.ශත | 2020 රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 14,645,465 | 85,470,575 |
| වර්ෂයේ එකතුකිරීම් | 32,000,000 | 10,000,000 |
| වර්ෂයේ ඉවත්කිරීම් | 32,000,000 | 85,355,176 |
| පොලිය | 1,443,594 | 4,530,066 |
| අවසාන ශේෂය | **16,089,059** | **14,645,465** |

## 6 මුදල් ප්‍රවාහ සඳහා සටහන්

| විස්තරය | 2021 රු.ශත | 2020 රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 17,013,369 | 20,159,559 |
| වර්ෂයේ ලැබීම් | 231,208,061 | 139,401,890 |
| වර්ෂයේ ගෙවීම් | 232,433,610 | 142,548,079 |
| අවසාන ශේෂය | **15,787,820** | **17,013,369** |

## 7 විවිධ ණයගැතියෝ

### සටහන් 7.1 - ජාතික ලොතරැයි මණ්ඩලය

| විස්තරය | 2021<br>රු.ශත | 2020<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 16,526,293 | 19,361,917 |
| වර්ෂයේ ආදායම | 12,895,300 | 10,349,536 |
| ගැලපීම් | | 1,814,840 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් | - | 15,000,000 |
| අවසාන ශේෂය | **29,421,593** | **16,526,293** |

### සටහන් 7.2 - ස්ථාවර තැන්පතු පොලී

| විස්තරය | 2021<br>රු.ශත | 2020<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 1,443,594 | 4,212,740 |
| වර්ෂයේ පොලිය | 1,109,881 | 2,249,457 |
| වර්ෂයේ ඉවත්කිරීම් | - | |
| අවසාන ශේෂය | **849,304** | **1,443,594** |

## 8 ඒකාබද්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| විස්තරය | 2021<br>රු.ශත | 2020<br>රු.ශත |
|---|---|---|
| 2021.01.01 දිනට සමුච්චිත අරමුදල | 49,141,721 | 129,414,630 |
| 2021 වර්ෂයේ ඌණතාවය/අතිරික්තය | 12,466,552 | (79,788,741) |
| වෙනත් ගැලපීම් | | (484,168) |
| **2021.12.31 දිනට සමුච්චිත අරමුදල** | **61,608,273** | **49,141,721** |

## 9 විවිධ තැන්පත්

| විස්තරය | 2021<br>රු.ශත | 2020<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 340,000 | 805,000 |
| වර්ෂයේ ලැබීම් | - | 150,000 |
| වර්ෂයේ ගෙවීම් | 10,000 | 615,000 |
| අවසාන ශේෂය | **330,000** | **340,000** |

## 10 උපචිත වියදම

| විස්තරය | 2021<br>රු.ශත | 2020<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 147,000 | 800,000 |
| වර්ෂයේ එකතුකිරීම් | 209,503 | 147,000 |
| වර්ෂයේ ගෙවීම් | 147,000 | 800,000 |
| අවසාන ශේෂය | **209,503** | **147,000** |

.................................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 2022/02/28

**එස්.එන්. හපුආරච්චි**

ප්‍රධාන ගණකාධිකාරි

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,

කොළඹ 07

ඇමුණුම 01

# ජාතික ක්‍රීඩා අරමුදල
## 2021.12.31 දිනෙන් අවසන් දිනට ශේෂ පිරික්සුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තර | හර | බැර |
|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. |
| | | | | සමුච්චිත අරමුදල - 2021.01.01 දිනට | | 49,141,721 |
| | | | | ආයෝජන ගිණුම | 16,089,059 | |
| 1 | 1 | | | ප්‍රදාන | | 177,125,000 |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | | |
| 1 | 2 | | | ජාතික ලොතැරැයි මණ්ඩලය ආදායම ලැබිය යුතු - 2021.01.01 දිනට | 16,526,293 | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | | 1,154,400 |
| 2 | 2 | | | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 849,304 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | | 20,875,000 |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | | |
| 4 | 1 | | | තැන්පතු ගිණුම | | 330,000 |
| 4 | 2 | | | වෙනත් | | 599,415 |
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 108,145,941 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 8,215,107 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 631,898 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 940,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 55,655,500 | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 15,400,000 | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 363,500 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 150,000 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තුවෙන්කිරීම | | 150,000 |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 10,118,170 | |
| 6 | 5 | 1 | 4 | වෙනත් - ගෙවිය යුතු | | 59,503 |
| 6 | 5 | 2 | 1 | අභියායචනා උපදේශණ කමිටුව | 212,258 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 350,190 | |
| | | | | මුදල් ශේෂය | 15,787,820 | |
| | | | | | | |
| | | | | | 249,435,039 | 249,435,039 |

...........................................................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2022/02/28

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | ලැබීම් 2021 | ලැබීම් 2021 |
|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. |
| | | | | ජනවාරි 01 දිනට ශේෂය | | 17,013,369 |
| 1 | 1 | | | ප්‍රදාන | 177,125,000 | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | 32,000,000 | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 305,096 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 20,875,000 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 902,965 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | | |
| 4 | 2 | | | වෙනත් | | |
| | | | | | | |
| | | | | ලැබීම් එකතුව | 231,208,061 | 248,221,430 |

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2021 ගෙවීම් | 2021 ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | 32,000,000 | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 108,145,941 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 8,215,157 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 631,898 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 940,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 55,955,500 | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 15,400,000 | |
| 6 | 4 | 3 | | නිලධාරීන්ගේ හැකියා වර්ධනය | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 367,000 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 147,000 | |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | 10,000 | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 10,058,667 | |
| 6 | 5 | 2 | 1 | අභියායවනා උපදේශණ කමිටුව | 212,258 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 350,190 | |
| | | | | | | |
| | | | | | | |
| | | | | එකතුව | | 232,433,610 |
| | | | | දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය | - | 15,787,820 |

.........................................
ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය : 2022/03/28

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

ඇමුණුම - 03

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2021 | ආදායම් 2021 |
|---|---|---|---|---|---|---|
| | | | | | රු | රු |
| | | | | | | |
| 1 | 1 | | | ප්‍රදාන | 177,125,000 | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 12,895,300 | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 1,154,400 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 20,875,000 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 599,415 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | | |
| 4 | 2 | | | වෙනත් | | |
| | | | | | | |
| | | | | ආදායම් එකතුව | | 212,649,115 |

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2021 වියදම් | 2021 වියදම් |
|---|---|---|---|---|---|---|
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 108,145,941 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 8,215,107 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 631,898 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 940,000 | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 55,655,500 | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 15,400,000 | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 363,500 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 150,000 | |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 10,118,170 | |
| 6 | 5 | 2 | 1 | අභියායචනා උපදේශණ කමිටුව | 212,258 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව. | 350,190 | |
| | | | | ජාතික ක්‍රීඩා උළෙල | | |
| | | | | | | |
| | | | | එකතුව | | 200,182,563 |
| | | | | අතිරික්තය | - | 12,466,552 |

.................................................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය :

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SYA/A/NSF/6/21/11

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 නොවැම්බර් 11 දින

SECRETARY
15 NOV 2022
RECEIVED

ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

63

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති රෙගුලාසි යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(i)මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2ක් ඉක්ම වූ එකතුව රු.260,000 ක ආරක්ෂක ඇප තැන්පතු 26ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

62

| | |
|---|---|
| (ii)මුදල් රෙගුලාසි 877 (1) (ඈ) ඡේදය | 2021 වර්ෂයේ ජාතික ක්‍රීඩා අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (iii)මුදල් රෙගුලාසි 877 (2) (ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්යසාධන වාර්ථාවක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ 1.2 | සමාලෝචිත වර්ෂයේදී ජාතික ක්‍රීඩා අරමුදලේ පරිපාලන කටයුතු වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යංශයේ නිලධාරීන් 08 දෙනෙකු වෙත ගෙවා තිබූ රු.363,500 ක් වූ දීමනා සහ උසස් කාර්යසාධන වැඩසටහන යටතේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරුවන් 03 දෙනෙකු වෙත ගෙවන ලද රු.1,500,000 ක් වූ ක්‍රීඩා පුහුණුකරු දීමනා සඳහා ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අමාත්‍යවරයාගේ අනුමැතිය මත පමණක් ගෙවීම් සිදු කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදන කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 22 වන වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවා තිබුණි. මේ අනුව පසුගිය සිව්වසරක කාලය තුළ ජාතික ක්‍රීඩා අරමුදල මගින් ලබා දී ඇති

දායකත්වය අනුව ශ්‍රී ලංකාව ක්‍රීඩා ක්ෂේත්‍රය තුල ලබාගත් ජයග්‍රහනයන් සම්බන්ධයෙන් මෙතෙක් ශ්‍රී ලංකාව සහභාගී වූ ඔලිම්පික් ක්‍රීඩා උළෙලවල් 19 කදී රිදී පදක්කම් 02ක් පමණක් ජයග්‍රහණ කර තිබුණු අතර පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරග වලදී 2014 රිදී පදක්කමක් හා 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාව රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කම් 5 ක් ලබාගෙන තිබීම ඉහළ ජයග්‍රහණයක් වුවද, 2022 වන විට එය එක් රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කම් 03 ක් දක්වා පහත බැස තිබුණි. තවද 2014 වර්ෂයේ දී ක්‍රිකට් තරග සඳහා රන් පදක්කමක්ද, කාන්තා ක්‍රිකට් තරග සඳහා රිදී පදක්කමක්ද දිනාගෙන තිබුණු අතර 2018 වසර තුල දී කිසිදු පදක්කමක් දිනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශනය අනුව වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කරගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන බව දන්වා තිබුණි. එසේ වුවද රු.200,182,563 ක් වූ මුළු වියදමින් සියයට 2 ක් වූ රු.4,050,000 ක් පමණක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම සඳහා වියදම් කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රීඩකයන්ගේ පෝෂණ තත්වය ඉහළ දැමීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කෞශල්‍යයන් වර්ධනය කොට ජාත්‍යන්තර දක්ෂතා ඉලක්ක කර ගනිමින් ආරම්භ කොට ඇති උසස් දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් 60ක් සඳහා මාසිකව රු.25,000ක පෝෂණ මල්ලක් ප්‍රදානය කිරිමට අදාලව අනුග්‍රාහකත්වය ලබා දීමට පුද්ගලික ආයතනයක් එකඟතාවය පලකර රු.9,000,000 ක් ජාතික ක්‍රීඩා අරමුදල වෙත බැර කර තිබුණි. මෙම කාර්යය සඳහා අනුග්‍රාහකත්ව ආයතනය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමක් ඇති කරගෙන නොතිබුණි. ක්‍රීඩකයන් වෙත ලබා දෙනු ලබන පෝෂණ දීමනාව මගින් ක්‍රීඩකයන් ලබාගත යුතු පෝෂණීය ආහාර වර්ග පිළිබඳ පෝෂණවේදීන්ගේ උපදෙස් ලබාගෙන නොතිබුණු අතර මෙම දීමනාව මගින් ක්‍රීඩකයන්ගේ පෝෂණීය අවශ්‍යතා සපුරා ගෙන තිබේද පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ක්‍රීඩකයන්ගේ පෝෂණ දීමනා ගෙවීම් සඳහා මෙම මූල්‍ය අනුග්‍රහය ලබාදී ඇතත් එයට අමතරව උසස් කාර්යය සාධන වැඩසටහන යටතේ විදේශගතව ක්‍රීඩා පුහුණුව ලබන ක්‍රීඩකයන් දෙදෙනෙකු සඳහා දිරි දීමනා ලෙස රු.4,165,007 ක් ගෙවා තිබුණි. මේ අනුව අනුග්‍රාහක ආයතනයෙන් ලද රු.මිලියන 09 ක මුදලින් අදාල කාරණය සඳහා ක්‍රීඩකයින් 54 දෙනෙකු වෙත මාස 03ක කාලයක් සඳහා රු.4,050,000 ක් පමණක් වැය කර තිබුණි.

(ඇ) 2020 ටෝකියෝ පැරාලිම්පික් තරඟාවලියේදී රන් හා රිදී පදක්කම් දිනා ගත් ක්‍රීඩකයන් දෙදෙනෙකු හා ඔවුන්ගේ පුහුණුකරුවන් වෙත ජාතික ක්‍රීඩා සභාවේ නිර්දේශ පරිදි මූල්‍ය ත්‍යාග ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 96 ක් වූ ප්‍රතිපාදන ලබා දී රු.91,125,000 ක් ගෙවා තිබුණද එයට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් නොමැති විශේෂ දක්ෂතා දැක්වූ තවත් ක්‍රීඩකයන් 05 දෙනෙකුට හා ඔවුන්ගේ පුහුණුකරුවන් වෙත රු. 8,125,000 ක් ගෙවා තිබුණි.

(ඉ) මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේදී ජාතික ක්‍රීඩා අරමුදල මගින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.9,157,992 ක් ලබාදී තිබුණ අතර මුළු වියදම රු.7,265,483 ක් වූයෙන් ඉතිරි මුදල වන රු.1,892,509 ක් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර ඇතත් අරමුදල වෙත ආපසු ලබාගැනීමට මේ වන විට ද කටයුතු කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගෙවීම් කිරීමෙන් අනතුරුව බිල්පත් හා ගෙවීම් වවුචර් පිටපත් හා වැඩ අවසන් කිරීමේ වාර්තාවන් ඇතුළු එම ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධ වාර්තා අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) දැනට පවතින ක්‍රීඩා පාසල්වල භෞතික සම්පත් ලබා දීම සම්බන්ධ යෝජනාවකට අනුව අත්‍යවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ මූලික උපකරණ මිල දී ගැනීමට සහ ප්‍රවාහනයට ක්‍රීඩා අරමුදල මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2020 වර්ෂයේ රු.5,000,000 ක් ලබා දී තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි ප්‍රගතිය 2020 අගෝස්තු 31 දිනට ප්‍රථම ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලෙස දක්වා තිබුණද මෙම මිල දී ගැනීම් සහ උපකරණ බෙදා හැරීම් පිළිබඳ තොරතුරු හා ප්‍රගති වාර්තා ලබා ගෙන නොතිබුණු අතර, වටිනාකම රු.4,644,600 ක් සඳහා පමණක් ක්‍රීඩා උපකරණ මිලදී ගෙන තිබුණි.

(උ) පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හා ආසියානු ක්‍රීඩා උළෙල ඉලක්ක කරමින් උසස් කාර්ය සාධන වැඩසටහන යටතේ ක්‍රීඩකයන්ගේ හැකියාවන් වර්ධනය කර අදාල තරග ජයග්‍රහණය කිරීම අපේක්ෂාවෙන් ක්‍රීඩාවන් 06 ක් සඳහා තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණු කරුවන් සඳහා ජාතික ක්‍රීඩා අරමුදල මගින් 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා රු.75,215,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. මෙම දීමනාව ගෙවීමේදී ක්‍රීඩකයන් 60 දෙනෙකු සහ පුහුණුකරුවන් 32 දෙනෙකු තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය හා එයට අදාළ නිර්නායකයන්, ක්‍රීඩකයෙකු සඳහා රු.100,000 ක සහ පුහුණුකරුවෙකු සඳහා රු. 50,000 ක දිරිදීමනා වටිනාකම් තීරණය කිරීමට පදනම් වූ කරුණු, දීමනා ගෙවීම් තීරණය

කිරීමට ප්‍රථම මෙම ක්‍රීඩකයන් හා පුහුණුකරුවන් සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ඔලිම්පික් කමිටුව සහ ක්‍රීඩා සංගම් විසින් ලබා දී ඇති වෙනත් ප්‍රතිලාභ පිළිබඳ ඇගයීම, ක්‍රීඩකයන්ගේ හා පුහුණුකරුවන්ගේ මාසික කාර්යසාධනය අගයකිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සහ ක්‍රීඩකයන් සහ පුහුණුකරුවන් සමඟ ගිවිසුම් ඇති කර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ඌ) උසස් කාර්ය සාධන වැඩසටහන් යටතේ දීමනා ලබා ගත් ක්‍රීඩකයින් 35 දෙනෙකු පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා තෝරාගෙන නොතිබුණු අතර, ක්‍රීඩා උළෙල සඳහා අනුමැතිය හිමිවූ ක්‍රීඩකයන් 14 ක් වෙත දීමනාව ලබා දී නොතිබුණි.මේ අනුව ඉහළ දක්ෂතා පෙන්වා පදක්කම්ලාභී ඇතැම් ක්‍රීඩකයින් වෙත මෙම දීමනාව ලබා දී නොමැති බව නිරීක්ෂණය විය.

(එ) ජාතික ඔලිම්පික් කමිටුව විසින් 2021 වර්ෂයේ සය මාසික පූර්ණ ශිෂ්‍යත්වයක් මත පුහුණු කටයුතු සඳහා විදේශගත කර තිබුණු ක්‍රීඩකයෙකුට උසස් කාර්ය සාධන වැඩසටහන යටතේ මාස 10 ක කාලයක් සඳහා රු.1,000,000 ක දීමනාවක් සහ රු.75,000 ක පෝෂණ දීමනාවක් ගෙවා තිබුණි. එයට අමතරව විදේශගතව පුහුණුව ලබන තවත් ක්‍රීඩකයෙකු වෙත මාස 03 ක් සඳහා රු.300,000 ක් ද ඉතිරි මාස 07 ක් සඳහා ඇ.ඩො.1500 බැගින් රු.2,082,946 ක් ද ජාතික ක්‍රීඩා අරමුදලෙන් ගෙවා ඇතත් එම ක්‍රීඩකයන් දෙදෙනා පුද්ගලික හේතුවක් මත බව දක්වමින් 2022 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශීය වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් ලබාගන්නා කුසලතා, ශ්‍රේණිගත කිරීම් හා ජයග්‍රහණ සම්බන්ධව දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2018 හා 2019 වර්ෂවල පැවති ඌනතාවය පිළිවෙලින් රු.26,110,111 ක් හා රු.6,495,405 ක් වූ අතර 2020 වර්ෂය වන විට රු.49,928,743 ක් වූ ආදායම මෙන් තුන්ගුණයකට ආසන්න රු.127,717,485 ක්ව වියදමක් පැවතීම හේතුවෙන් රු.77,788,742 ක මූල්‍ය ඌනතාවයක් පැවතුණි. මෙම වර්ෂ තුනෙහි මූල්‍ය කාර්යසාධනයේ පසුබෑමක් දක්නට ලැබුණද 2021 වර්ෂයේදී ආදායම රු.212,649,115 ක් හා වියදම රු.200,182,563 ක් වූයෙන් රු.මිලියන 12 කට අධික මූල්‍ය අතිරික්තයක් ලගා කරගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති